අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය - 2018

---------------------------------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී,මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ.  කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

## 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ඇස්තමේන්තු ප්‍රතිශෝධනයක් ලෙස ගැලපිය යුතු මණ්ඩලයේ රථ වාහන හා වායු සමීකරණ යන්ත්‍ර ක්ෂය වෙන් කිරීමේ ප්‍රතිශතය සියයට 20 සිට 12.5 දක්වා අඩු කිරීම 2017 වර්ෂයේදී අතීතානුයෝගීව ගැලපීම හේතුවෙන් ජංගම නොවන වත්කම් අගය රු.14,111,960 ක් වැඩියෙන් දක්වා තිබුණි. මෙම වරද නිවැරදි කිරීමට ප්‍රවර්ථන වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 3 ප්‍රකාරව ක්ෂය වෙන් කිරීමේ ප්‍රතිශතය 20% සිට 12.5% දක්වා අඩු කිරීම 2017 වර්ෂයේදී අතීතානුයෝගීව ගැළපීම නිවැරදිව සිදුකර ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතු බව. |

## 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) | | |
| 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධන වාර්තාවට අනුව මණ්ඩලයේ මෙහෙයුම් ආදායම රු.45,226,997 ක් වුවද එකතු කළ අගය මත බදු වාර්තා අනුව හා ජාතිය ගොඩනැගීමේ බදු | .45,226,997<br><br>45,226,997 | 46,436,105 (එකතු කළ අගය මත බදු වාර්තා අනුව මෙහෙයුම් ආදායම)<br>43,875,305 (ජාතිය ගොඩනැගීමේ බදු වාර්තා අනුව මෙහෙයුම් ආදායම) | 1,208,108<br><br>(1,352,692) | 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධන වාර්තාවට අනුව වර්ෂයටම අදාල එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීම් නිවැරදිව සිදුකර ඇත.එහෙත් කාර්තුමය වාර්තා දේශිය ආදායම්වෙත ඉදිරිපත් කිරීමේදී කාර්තු අතර වෙනසක් සිදුවී ඇත.මේ සඳහා නිවැරදි ලද | පාලන ගිණුම් හා අදාල උපලේඛන කලින් කලට සැසඳීම් කළ යුතු වීම |

| | |
|---|---|
| වාර්තා අනුව එම ආදායම පිළිවෙලින් රු.46,436,105 ක් හා රු.43,875,305 ක් විය. එම ආදායමේ වෙනසට හේතු විගණනයට ඉදිරිපත් නොවීය. | සංශෝධිත වාර්තා හැකි ඉක්මනින් ලබාදෙන බව දන්වමි. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) අංක පීඊඩී/12 දරන 2003 ජුනි 20 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.3 ඡේදයේ (ඇ) වගන්තිය | මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් කාර්යාලීය අත් පොතක් සහිතව නිකුත් කර තිබුණද ඒ සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මානව සම්පත් කළමනාකරණ අත්පොතට අනුමැතිය ලබා ගැනීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් වෙත ඉදිරිපත් කර ඇත. | අදාළ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව |
| (ආ) අංන 5/2016 දරන 2016 මාර්තු 31 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය | පසුගිය වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණය නිමකර වාර්තා විගණකාධිපති වෙත යොමු කර ඊළඟ වර්ෂයේ මාර්තු 31 දිනට පෙර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දිය යුතු වුවද 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2019 මැයි 08 දින වන විටත් නිමකර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ ඌණතාවය ඊට හේතු විය. | අදාළ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව |
| (ඇ) පීඊඩී/12 දරන 2003 ජුනි 02 දිනැති පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය | ගිණුම් වර්ෂය අවසාන වී දින 150 කට පසුව මණ්ඩලයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2019 මැයි 10 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව හැකි ඉක්මනින් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරමි. | අදාළ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.10,139,790 ක අතිරික්තයක්වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,686,862 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,452,928ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට 2018 වර්ෂයේ ආදායම රු.10,340,435 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

මණ්ඩලයේ ප්‍රතිතන ආදායම හා පුහුණු වැඩසටහන් ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්ථන වර්ෂයේදී පිළිවෙලින් රු.7,566,430 කින් හා රු.1,227,109 කින් වර්ධනය වී ඇති අතර පෞද්ගලික පඩි නඩි වියදම රු.2,527,578 කින් වර්ධනය වී තිබුණි. ගමන් වියදම් සඳහා දරන ලද වියදම පසුගිය වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්ථන වර්ෂයේදී රු.1,244,110 කින් අඩු වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

2018 වර්ෂයේ ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පිළිවෙලින් 4.09:1 ක් හා 4.89:1 ක් වූ අතර 2017 වර්ෂයේදී එම අනුපාත පිළිවෙලින් 4.89:1 ක් හා 4.76:1 ක් වශයෙන් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අතිරේක අධ්‍යක්ෂ තනතුර කාර්යමණ්ඩල පරිපාටිය අනුමත කරගත් දින සිටම පුරප්පාඩුව පවතින අතර, බඳවා ගැනීම සඳහා 2012 වර්ෂයේ සිට කටයුතු සැලසුම් කර තිබුණද එම තනතුරට බඳවා ගැනීම් කර නොතිබුණි. අංක ඩීඑම්එස්/1601 | අතිරේක අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීම සඳහා 2012 සහ 2013 වර්ෂවල දී කැඳවන ලදි. එහෙත් සුදුසු අයදුම්කරුවෙතකු තෝරාගැනීමට නොහැකි විය. 2014 ඔක්තෝම්බර් 14 දිනැති කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය ප්‍රකාරව වැටුප්තලය සංශෝධනය කර කොන්ත්‍රාත් පදනමට බඳවා ගැනීමට අවසරය ලද මුත් සමානතලයේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් | පුරප්පාඩු තනතුරුවලට බඳවා ගැනීම් කිරීමට කටයුතු කල යුතු බව. |

| | | |
|---|---|---|
| හා 2014 ඔක්තෝබර් 14 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය ප්‍රකාරව වසරින් වසර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමේ පදනම මත බඳවා ගැනීමට අනුමැතිය ලැබී තිබියදීත් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | බොහෝදෙනෙකු සමානතලයේ ආයතනවල දැනට ස්ථිර පදනමේ සේවයේ නියුතු අය බැවින් ඔවුන් අයදුම් කිරීමට මැලිකමක් දක්වයි.මෙම තතත්වය සලකාබලා අතිරේක අධ්‍යක්ෂ තනතුර ආරම්භයේ තිබූ පරිදි ස්ථිර පදනමේ තත්වයට නැවත පරිවර්තනය කරන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇත.එහෙත් ඒ සඳහා මෙතෙක් විසඳුමක් ලැබී නොමැත. | |
| (ආ) කණිෂ්ඨ කළමනාකරු (ලේකම්) තනතුරු 01, තාක්ෂණ නිලධාරී (තොරතුරු තාක්ෂණ) තනතුරු 01 ක් හා රියදුරු තනතුරු 01 ක් 2019 මැයි 02 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් කණිෂ්ඨ කළමනාකරු (ලේකම්) තනතුර,කොන්ත්‍රාත් පදනම මත ලබාදී තිබුණි.එසේ නොවන්නේ නම් ඒ සඳහා MA 1-2 යටතේ කළමනාකරණ සහකාර තනතුරක් ස්ථිර පදනමින් ලබාදිය හැකි බවද ලිඛිතව දන්වා තිබුණි.ඒ අනුව MA 1-2 සේවා ගණයේ තනතුරට සථිර පදනමින් ලබාදෙන ලෙස කරන ඉල්ලීමක් AD-FL-01/2018//11/001 යොමු අංකයෙන් 23.11.2018 දින සිදු කරන ලදී. අලුතින් කළමනාකරණ තනතුරක් අනුමත කර ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. තාක්ෂණික නිලධාරී තනතුර සඳහා සහභාගී වූයේ එක් අයදුම්කරුවෙකු පමණි. නමුත් පසුව ඔහුද ද පත්වීම භාර ගැනීමට අකමැති බව දන්වා එවන ලදී. | පුරප්පාඩු තනතුරුවලට බඳවා ගැනීම් කිරීමට කටයුතු කල යුතු බව. |
| (ඇ) මණ්ඩලය විසින් අනුකූලතා තක්සේරු කටයුතුවල යෙදවීමට විධායක මට්ටමට පහළ ශ්‍රේණිවල බඳවා ගැනීමේ තනතුරු ඇති කිරීමට දිගින් දිගටම කටයුතු කර නොතිබූ අතර මේ හේතුවෙන් මණ්ඩලයේ කටයුතු ප්‍රවර්ධනය කිරීමට නොහැකි වී තිබුණි. | විධායක මට්ටමින් පහළ කණිෂ්ඨ කළමනාකරු (තොරතුරු තාක්ෂණ), කණිෂ්ඨ කළමනාකරු ලේකම් හා කළමනාකරණ සහකාර තනතුර සඳහා එක් තනතුරකින් එක් පුරප්පාඩුවක් සඳහා තිදෙනෙකු බඳවා ගැනීමට තිබුණි.ඒ අනුව ඉහත සඳහන් කරුණු අනුව කටයුතු කරන ලදී.කණිෂ්ඨ කළමනාකරු ලේකම් තනතුර වෙනුවට කළමනාකරණ සහකාර තනතුරක් ලබා දිමට | මණ්ඩලයේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා විධායක මට්ටමට පහළ ශ්‍රේණියක් ඇති කර ඒ සඳහා බඳවා ගැනීම් කිරීමට |

| | | |
|---|---|---|
| | 2016 වර්ෂයේදී ලිඛිතව එකගව තිබූ බැවින් ළඳදීම පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයෙන් ඒ සඳහා ද බඳවා ගැනීමට අනුමැතිය ඉල්ලා යැවූ ලිපියට නැවත පිළිතුරු ලැබුණේ කණිෂ්ඨ කළමනාකරණ ලේකම් (කොන්ත්‍රාත් පදනම) අත්හිටුවිය නොහැකි බවත් දැනට සිටින කළමණාකරණ සහකාර තනතුරකින් එම කාර්යය ඉටුකර ගැනීමේ වරදක් නැති බවයි. | කටයුතු කල යුතු බව. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මහජනතාව අතර ප්‍රතීතනය ප්‍රචලිත කිරීම අරමුණු කර ගනිමින් සිදු කිරීමට සැලසුම් කළ කාර්යයන් අතර පුවත්පත් දැන්වීම් හතරක් 2018 වර්ෂය තුළ පළ කිරීමට නියමිතව තිබුණද එක් පුවත්පත් දැන්වීමක් හෝ පලකර නොතිබුණි. | 2018 වසර තුළදී ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් අපගේ සේවා ලාභීන් පිළිබඳව සමීක්ෂණය නිම කර ඇති අතර එහි ප්‍රතිඵල විශ්ලේෂණයද මේ වන විට සම්පූර්ණ කර ඇත. 2018 වසර තුළ සාමාන්‍ය ජනතාව දැනුවත් වීමේ මට්ටම හඳුනා ගැනීම සඳහාද සමීක්ෂණයක් සැලසුම් කර තිබුණද පහත සඳහන් කරුණු මත එය තව වසර දෙකකින් පමණ පසු ක්‍රියාත්මක කිරීම සුදුසු බව තීරණය කරන ලදී.<br>(i) ප්‍රතීතනය තාක්ෂණික කරුණු හා බැඳුණු ක්‍රියාවලියක් වන අතර දැනට දිවයින පුරා සාමාන්‍ය ජනතාව අතර මේ පිළිබඳව ඇත්තේ අල්ප දැනුමකි.<br>(ii) එබැවින් මෙම සමීක්ෂණය සඳහා වැය වන සම්පත් උපරිම කාර්යක්ෂමතාවයකින් යොදා ගැනීම සඳහා පළමුව දැනුවත් කිරීමේ ක්‍රියාවලිය සිදුකර ඉන්පසුව සමීක්ෂණය සිදු කිරීම වඩාත් ප්‍රතිඵලදායක වන බව | සැලසුම් කිරීමේදී ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘතිද යන්න විශ්ලේෂණය කර සැලසුම්වලට ඇතුලත් කළ යුතු වීම හා සැලසුම් කළ කටයුතු වර්ෂය තුලදී නිම කිරීමට කටයුතු සිදුකළ යුතු වීම. |
| (ආ) මණ්ඩලය විසින් කැබිනට් තීරණවලට අදාල නියාමකයින් හා ඔවුන්ගේ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා 2018 වර්ෂය තුළ රැස්වීම් 15 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද එක් රැස්වීමක් හෝ වර්ෂය තුළ පැවැත්වීමට මණ්ඩලයට හැකිවී නොතිබුණි. | රට තුළ ක්‍රියාත්මක වන නියාමන ආයතන ප්‍රතීතන ක්‍රියාවලියට සක්‍රීයව දායක කර ගැනීම සඳහා 2019 වසර තුළ ප්‍රධාන නියාමන ආයතන සියල්ල සඳහා වැඩමුළුවක් පැවැත්වීමට සැලසුම් කොට ඇත. 2018 වසරේදී ලෝක ප්‍රතීතන දින ජාතික වැඩ සටහන් සඳහා නියාමන ආයතන වල සක්‍රීය දායකත්වය ලබා ගැනීම කටයුතු කොට ඇත. | ප්‍රවර්ථන වර්ෂයේදී සැලසුම් කරන ලද කටයුතු ඉටු කිරීමට කටයුතු කළ යුතු බව |